# 6 රෙදි වියනා මකුළු දැරිය



ඈත අතීතයේ කාලෙක යොසාකු කියලා තරුණ ගොවියෙක් හිටියා. එක දවසක් කුඹුරේ වැඩ කරමින් සිටිය දී සර්පයෙක් මකුළුවකු අල්ලා ගන්න හදන හැටි යොසාකු දැක්කා. යොසාකුට මකුළුවා ගැන හරියට දුක හිතුණා. ඔහු උදැල්ල අරං එතැනට දුවලා සර්පයා බය කර පැන්නුවා.

මකුළුවා තණ බිස්සේ හැංගුණා. ඒත් ඊට මොහොතකට කලින් ඒ මකුළුවා නතර වෙලා යොසාකුට හිස නමා ස්තුති කළා වගේ පෙනුණා.

දවසක් උදේ යොසාකු විවේකයෙන් ගෙදර හිටියා. කවුදෝ සිහින් හඬකින් එළියෙ ඉඳන් කතා කරනවා ඔහුට ඇහුණා.

"යොසාකු, යොසාකු"
දොර ඇරියා ම එළියෙ ලස්සන ගෑනු ළමයෙක් හිටගෙන හිටියා.

"ඇඳුම් මහගන්න ඔබතුමා රෙදි වියන්නියක් හොයනවා කියලා ආරංචියි," ගෑනු ළමයා කිවුවා. "මෙහෙ නැවතිලා රෙදි වියන්න මට ඉඩ දෙනවා ද?"

මේක ඇහුවා ම යොසාකුට හරි සතුටුයි. ඇත්තට ම ඔහු උදව්වට කවුරු හරි සොයමින් හිටියෙ. යොසාකු ගෑනු ළමයාට රෙදි වියන කාමරය පෙන්නුවා.

ඇය කපු පුලුන් ටික ළං කර ගෙන වැඩ පටන් ගත්තා. දවස අවසානයේ දී ගෑනු ළමයා කරලා තියෙන වැඩ බලන්න යොසාකු කාමරයට ගියා. ඒ වන විටත් ඇය කිමෝනෝ අටක් මහන්න ප්‍රමාණවත් රෙදි කෑලි අටක් වියා තිබුණා. යොසාකුට හරි පුදුමයි. එක දවසකට මේ තරම් ප්‍රමාණයක් රෙදි වියන්න පුළුවන් කෙනකු ගැන යොසාකු කවදාවත් අහලා තිබුණේ නෑ.

"ඔයාට කොහොම ද ඔච්චර රෙදි ගොඩක් වියන්න පුළුවන් වුණේ," ඔහු ගෑනු ළමයාගෙන් ඇහුවා.

ඊට පිළිතුරු දෙනවා වෙනුවට ඇය මෙහෙම කිවුවා. "ඔබතුමා ඒ ගැන අහන්න එපා. ඒ වගේ ම මං වැඩ කරන වෙලාවට ඔබතුමා කාමරේට එන්නත් එපා."

එහෙත් යොසාකුට තිබුණේ පුදුම කුතුහලයක්. ඒ නිසා ඔහු දවසක් රෙදි වියන කාමරයේ ජනේලයෙන් හොරෙන් එබිලා බැලුවා. දුටු දෙයින් ඔහු හොඳට ම පුදුම වුණා.

ඒ කාමරයේ සිටියේ ගෑනු ළමයෙක් නොවෙයි. කකුල් අටකින් වේගයෙන් රෙදි වියමින් සිටි විශාල මකුළුවෙක්! ඌ රෙදි වියන්න නූල් හදා ගත්තෙ තමන්ගෙ කටින් ආ මකුළු දැලකිනුයි.

ඒ ඉන්නේ තමන් එදා සර්පයාගෙන් බේරා ගත් මකුළුවා ම බව යොසාකු හඳුනා ගත්තා. ඒ සමග ම ඔහුට සියල්ල වැටහුණා. මකුළුවා කළගුණ දන්නා කෙනෙක්. දැන් ඒ මකුළුවාට අවශ්‍ය යොසාකුට ප්‍රතිඋපකාරයක් කරන්න. ඒ නිසා මකුළුවා ලස්සන ගෑනු ළමයකුගේ වේශයෙන් ඇවිත් රෙදි වියනවා. මකුළුවා කාමරයේ තිබූ කපු පුලුන් කාලා රෙදි වියන්න නූල් වමාරනවා.



මකුළුවා තමාට කරන මේ උදව්වට ස්තුති කරන්න යොසාකුට වචන නෑ.

කාමරයේ තිබුණු කපු පුලුන් ටික ඉවර වෙන්නත් ළඟ බව ඔහු දැක්කා. යොසාකු ඊට පසුව දා උදෙන් ම කන්දෙන් එහා පැත්තෙ තිබුණ ගම්මානයට ගියා. පුලුන් ටිකක් මිලට ගත්තා. ඒ පුලුන් ටික පොදි බැඳගෙන කරේ තියා ගත්තා. ගෙදර එන්න පිටත් වුණා.

අතරමගදි ඉතා ම භයානක දෙයක් සිදු වුණා. යොසාකු ගිමන් හරින්න මග වාඩි වුණා. ඒ වෙලාවේ ඔහු එදා එළවා දැමූ සර්පයා හෙමිහිට පුලුන් පොදියට රිංගා ගත්තා. යොසාකු ඒක දක්කේ නැහැ.



ඔහු පුලුන් පොදිය ගෑනු ළමයාට භාර දුන්නා. ඒ කපු පුලුන් ටික දැක්කා ම ගෑනු ළමයාට හරි සතුටුයි. මොක ද, ඒ වෙද්දි ගෙදර තිබුණු කපු පුලුන්වලින් රෙදි වියා ඉවරයි. ඇය පුලුන් පොදියත් රැගෙන රෙදි වියන කාමරයට ගියා.

රෙදි වියන කාමරයට ගිය සැණින් ඇය නැවත මකුළුවකු බවට හැරුණා. මකුළුවා වේගයෙන් කපු පුලුන් කන්න පටන් ගත්තා. කාගෙන කාගෙන ගිහින් පුලුන් පොදියෙ පතුලට ම කාලා ඉවර වුණා. පුලුන් පොදියෙ සිටි සර්පයා එකපාරට ම මකුළුවා අල්ලා ගන්න පැන්නා.

සර්පයා මහ විශාලෙට කට ඇරියා. බියට පත් මකුළුවා ජනේලයෙන් එළියට පැන දිවුවා. සර්පයා වේගයෙන් මකුළුවා පස්සෙ පැන්නුවා. මකුළුවා කොයි තරම් කපු පුලුන් කා සිටියා ද කියතොත්, උඟට වේගයෙන් දුවන්න බැරි වුණා. සර්පයා ඉක්මනින් ම මකුළුවාට ළං වුණා.





ඒ වෙලාවෙ මහ පුදුම දෙයක් සිදු වුණා. ඉර ඉහළ අහසේ සිට පහළ සිදු වන දේ බලා ගෙනයි සිටියේ. මකුළුවා යොසාකුට උදවු කළ ආකාරය ඉර දැනගෙන හිටියා. ඒ නිසා ඉක්මනින් හිරු කිරණක් පහළට එවුවා. මකුළුවාගේ කටින් එළියට ඇදුණු නූල් පොටේ කෙළවර එම කිරණින් අල්ලා ගත්තා. ඊට පස්සේ හෙමිහිට මකුළුවා ඉහළට ඇද ගත්තා. දැන් මකුළුවා ඉන්නේ සර්පයාට ළං වෙන්න බැරි තරම් උඩ.



සර්පයාගෙන් තමා බේරා ගැනීම ගැන මකුළුවා ඉරට ස්තුති කළා. ඇගේ තිබුණ කපු පුලුන්වලින් මකුළුවා ඉහළ අහසේ ලස්සන සුදු වලාකුළු රාශියක් ගොතාගෙන ගොතාගෙන ගියා.

වලාකුළු සුදු ම සුදු පාටට සුමුදුවට තිබෙන්නේ ඒ නිසා ලු. වලාකුළටයි මකුළුවාටයි ජපානයේ කියන්නේ එකම නමයි. ඒ තමයි **'කුමෝ'**.

ෆ්ලොරන්ස් සාකේඩ්ගේ Japanese Children's Favorite Stories කෘතියෙන් උපුටා ගත් කතාවකි. චූලානන්ද සමරනායකගේ පරිවර්තනය ඇසුරෙනි. චිත්‍ර - යොෂිසුකේ කුරොසාකි.

## අවබෝධය

1. පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර දෙන්න.

   i. මකුළුවා නූල් ලබා ගත්තේ මොනවායින් ද?

   ii. මකුළුවා යොසාකුට කළගුණ සැලකුවේ කෙසේ ද?

   iii. සර්පයා යොසාකුගේ රෙදි වියන කාමරයට පැමිණියේ කෙසේ ද?

   iv. ඉර, මකුළුවාට උදවු කළේ ඇයි?

   v. මකුළුවා හැඳින්වීමට ජපන් භාෂාවේ යෙදෙන වචනය කුමක් ද?

## ක්‍රියාකාරකම 1

මේ කතාවේ එක් එක් චරිතය ගැන ඔබේ අදහස් කෙටියෙන් දක්වන්න.

   i. යොසාකු

   ii. මකුළුවා

   iii. සර්පයා

   iv. ඉර

## ක්‍රියාකාරකම 2

**දී ඇති වාක්‍ය පාඨමට අනුව අර්ථය නිවැරදි වන සේ සකස් කර ලියන්න.**

උදාහරණ:- යොසාකුට මකුළුවා ගැන හරියට **සතුටු** හිතුණා.
යොසාකුට මකුළුවා ගැන හරියට **දුක** හිතුණා.

1. එළියෙ **අවලස්සන** ගෑනු ළමයෙක් හිටගෙන හිටියා.
2. මකුළුවා කළගුණ **නො දන්නා** කෙනෙක්.
3. යොසාකු කියලා **මහලු** ගොවියෙක් හිටියා.
4. සර්පයා **හෙමින්** මකුළුවා පස්සෙ පැන්නුවා.
5. ඉර, මකුළුවා **පහළට** ඇද ගත්තා.